# "නැණ සයුර" අධ්‍යාපනික වැඩසටහන-2022
## සරසවි පිවිසුම් අත්වැල
## උතුරු මැද පළාත් අධ්‍යාපන දෙපාතර්මේන්තුව

## සංයුක්ත ගණිතය - I පත්‍රය

13 ශ්‍රේණිය

කාලය - පැය 03 මිනිත්තු 10

නම : ......................................................................................................

**උපදෙස් :**

* මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විත වේ;
* ***A* කොටස** (ප්‍රශ්න 1-10 ) සහ *B* **කොටස** ( ප්‍රශ්න 11-17 )
* ***A* කොටස :**

  **සියලු ම** ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න. එක් එක් ප්‍රශ්නය සඳහා ඔබේ පිළිතුරු , සපයා ඇති ඉඩෙහි ලියන්න. වැඩිපුර ඉඩ අවශ්‍ය වේ නම්, ඔබට අමතර ලියන කඩදාසි භාවිත කළ හැකි ය.
* ***B* කොටස :**

  ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

**පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා පමණි.**

| (10) සංයුක්ත ගණිතය I | | |
|---|---|---|
| කොටස | ප්‍රශ්න අංකය | ලකුණු |
| A | 1 | |
| | 2 | |
| | 3 | |
| | 4 | |
| | 5 | |
| | 6 | |
| | 7 | |
| | 8 | |
| | 9 | |
| | 10 | |
| B | 11 | |
| | 12 | |
| | 13 | |
| | 14 | |
| | 15 | |
| | 16 | |
| | 17 | |
| | එකතුව | |

| | |
|---|---|
| I පත්‍රය | |
| II පත්‍රය | |
| එකතුව | |
| අවසාන ලකුණු | |

22 A/L අපි [ papers group ]

**අවසාන ලකුණු**

| | |
|---|---|
| ඉලක්කමෙන් | |
| අකුරින් | |

1) ගණිත අභ්‍යුහන මූලධර්මය භාවිතයෙන් , සියලු $n \in \mathbb{Z}^+$ සඳහා $\sum_{r=1}^{n} \frac{1}{(2r-1)(2r+1)} = \frac{n}{2n+1}$ බව පෙන්වන්න.

22 A/L අපි [ papers group ]

2) එකම රූප සටහනක $y = |3x+4|$ හා $y = x^2$ හි ප්‍රස්තාරවල දළ සටහන් අඳින්න. **ඒ නයින් හෝ අන් අයුරකින් හෝ** ,$|3x+4| \leq (x-1)^2$ අසමානතාව සපුරාලන $x$ හි සියලුම තාත්වික අගයන් සොයන්න.

3) ආගන්ඩ් සටහනක $|z - 2i| = 1$ සපුරාලන $z$ සංකීර්ණ සංඛ්‍යා නිරූපණය කරන ලක්ෂ්‍යවල පථයෙහි දළ සටහනක් අඳින්න. **ඒ නයින් හෝ අන් අයුරකින් හෝ** , $|z|$ හි අවම අගය හා උපරිම අගයද $\arg(z)$ හි අවම අගය හා උපරිම අගයද සොයන්න.

22 A/L අපි [ papers group ]

4) $(1 + kx)^6$ හි ප්‍රසාරණයේ $k$ යනු නියතයකි. $x^3$ හි සංගුණකය , $x^2$ හි සංගුණකයට වඩා දෙගුණයකින් වැඩිය. $k$ හි අගය සොයන්න.

5) $\lim_{x\to 0}\frac{\sqrt{9+x^3}-\sqrt{9-x^3}}{(1-\cos 4x)\left[(x+\sqrt{3})^4-9\right]}=\frac{1}{288\sqrt{3}}$ බව පෙන්වන්න.

22 A/L අපි [ papers group ]

6) $y=\sqrt{\frac{e^x+e^{-x}}{e^x-e^{-x}}}$, $x$ අක්ෂයෙන් ද $x=\ln\frac{3}{2}$ හා $x=\ln 2$ මගින් ආවෘත වර්ගඵලය $x$ අක්ෂය වටා රේඩියන් $2\pi$ වලින් භ්‍රමණය කරනු ලැබේ. මෙලෙස ජනනය වන ඝන වස්තුවේ පරිමාව $\pi\ln\frac{9}{5}$ බව පෙන්වන්න.

7) $t \neq 0$ සඳහා $x = 3t$ හා $y = \frac{3}{t}$ මගින් පරාමිතිකව දෙනු ලබන $C$ වක්‍රයට $\left(3t, \frac{3}{t}\right)$ ලක්ෂ්‍යයේදී වූ අභිලම්බයෙහි සමීකරණය $t^3x - ty + 3 - 3t^4 = 0$ බව පෙන්වන්න. $p \equiv \left(6, \frac{3}{2}\right)$ ලක්ෂ්‍යයෙහි දි $C$ වක්‍රයට ඇඳි අභිලම්බය නැවත $Q \equiv \left(3T, \frac{3}{T}\right)$ ලක්ෂ්‍යයෙහිදි $C$ වක්‍රය හමුවේ නම්, $8T^2 - 15T - 2 = 0$ බව පෙන්වන්න.

22 A/L අපි [ papers group ]

8) $3x + 4y + 5 = 0$ හා $12x - 5y - 3 = 0$ යන සරල රේඛා දෙක අතර , මූල ලක්ෂ්‍යය හරහා යන කෝණ සමච්ඡේදකයෙහි සමීකරණය සොයන්න.

9) $x - y = 0$ සහ $7x - y = 0$ සරල රේඛා දෙකම ස්පර්ශ වන සේ පළමු වෘත්ත පාදයෙහි පිහිටන අරය ඒකක $2\sqrt{2}$ වන වෘත්තයෙහි සමීකරණය සොයන්න.

22 A/L අපි [ papers group ]

10) $x$ හි සියලු තාත්වික අගයන් සඳහා , $\cos 4x + 3\sin 2x - 2 = a\, sin^2 2x + b\sin 2x + c$ වන සේ $a, b, c$ නිඛිල සොයන්න. **ඒ නයින්** $\cos 4x + 3\sin 2x = 2$ සමීකරණය විසඳන්න.

## $B$ කොටස

11.

a) $k \in \mathbb{R}^+$ විට $f(x) = kx^2 + (k-1)x + 1 - 2k$ යැයි ගනිමු. $f(x) = 0$ සමීකරණයට තාත්වික මූල ඇති බව පෙන්වන්න.

$f(x) = 0$ සමීකරණයේ මූල $\alpha$ හා $\beta$ නම්, $k$ ඇසුරෙන් $\alpha + \beta$ හා $\alpha\beta$ ලියා දක්වා ,මූල දෙකම ධන වන පරිදි වූ $k$ හි අගයන් සොයන්න.

තවද $\alpha^2$ හා $\beta^2$ මූල වන වර්ගජ සමීකරණය සොයන්න.

$f(x) = 0$ සමීකරණයේ එක් මූලයක් අනෙක් මූලය මෙන් තුන් ගුණයක් වේනම්, එවිට $k$ සඳහා ගත හැකි අගයන් සොයන්න.

b) $g(x) = ax^3 + bx^2 + cx - 4$ යැයි ගනිමු. මෙහි $a, b, c \in \mathbb{R}$ වේ. $(x^2 - 4)$ , $g(x)$ හි සාධක වේනම්, $b$ හි අගය සොයන්න.

$g(x)$, $2x^2 - kx$ මගින් බෙදූ විට ශේෂය $8x - 4k$ වේ. මෙහි $k \in \mathbb{R}$ වේ. $k, a$ හා $c$ හි අගයන් සොයන්න.

තව ද $a, b, c$ මෙම අගයන් ගන්නා විට $g(x)$, ඒකජ සාධක වල ගුණිතයක් ලෙස ලියන්න.

22 A/L අපි [ papers group ]

12.

a) " $BOOKKEEPER$" යන වචනයේ අකුරු සියල්ලම ගෙන සෑදිය හැකි වෙනස් වචන ගණන කීයද?

ඕනෑම අකුරු 4 ක් තෝරා ගත හැකි නම්, සෑදිය හැකි වෙනස් වචන ගණන සොයන්න.

b) $r \in \mathbb{Z}^+$ සඳහා $U_r = \frac{r+4}{r(r+1)(r+2)}$ වේ.

$U_r = 2V_r - V_{r+1}$ වන පරිදි $k$ සොයන්න. මෙහි $V_r = \frac{k}{r(r+1)}$; හා $k \in \mathbb{R}$ වේ.

$\sum_{r=1}^{n} \frac{U_r}{2^{r+1}} = \frac{1}{4} - \frac{1}{2^{n+1}(n+1)(n+2)}$ බව පෙන්වන්න.

$\sum_{r=1}^{\infty} \frac{U_r}{2^{r+1}}$ අපරිමිත ශ්‍රේණිය අභිසාරී බව අපෝහනය කර එහි ඓක්‍ය සොයන්න.

13.

a) $A = \begin{pmatrix} 1 & -1 \\ 2 & 3 \\ -1 & 2 \end{pmatrix}, B = \begin{pmatrix} 6 & 2 \\ a & 0 \\ b & 1 \end{pmatrix}, P = \begin{pmatrix} 3 & 5 \\ 2 & c \end{pmatrix}$ යැයි ගනිමු. මෙහි $a, b, c \in \mathbb{R}$ වේ.

$A^TB$ යනු කුටික සමමිතික න්‍යාසයක් නම්, $a = -1$ හා $b = 4$ බව පෙන්වන්න.

$B^TAP$ යනු සමමිතික න්‍යාසයක් නම්, $c$ සොයන්න.

$P^{-1}$ පවතින බව පෙන්වා එය ලියා දක්වන්න.

$a, b, c$ සඳහා මෙම අගයන් සහිතව ,$PD = A^TBP$ වන පරිදි $D$ සොයන්න.

b) $Z_1, Z_2, Z_3, Z_4 \in \mathbb{C}$ ලෙස ගනිමු.

I. $Z\bar{Z} = |Z|^2$ බව පෙන්වන්න

II. **ඒ නයින්** $|Z_1 + Z_2 + Z_3| = 1$ නම්, $|Z_1| = |Z_2| = |Z_3|$ සහ $\left|\frac{1}{Z_1} + \frac{1}{Z_2} + \frac{1}{Z_3}\right| = 1$ බව අපෝහනය කරන්න.

III. $|Z_1 Z_2| = |Z_1||Z_2|$ බව පෙන්වා $\arg(Z_1 Z_2) = \arg(Z_1) + \arg(Z_2)$ බව සාධනය කරන්න.

**ඒ නයින්** $|Z^2| = |Z|^2$ හා $\arg(Z^2) = 2\arg(Z)$ බව අපෝහනය කරන්න.

c) $z = \cos\theta + i\sin\theta$ නම්,ද මුවාවර් ප්‍රමේයය භාවිතයෙන් $z^n$ හා $\frac{1}{z^n}$ සඳහා ප්‍රකාශන ලියා දක්වන්න. $z^n + \frac{1}{z^n} = 2\cos n\theta$ බව පෙන්වන්න. මෙහි $n \in \mathbb{Z}^+$ වේ.

**ඒ නයින් හෝ අන් අයුරකින් හෝ** , $\cos 5\theta = 16\cos^5\theta - 20\cos^3\theta + 5\cos\theta$ බව පෙන්වන්න.

$\cos 5\theta = 0$ සමීකරණයේ මූල සලකා $4\cos\frac{\pi}{10}\cos\frac{3\pi}{10} = \sqrt{5}$ බව පෙන්වන්න.

**ඒ නයින්** $\cos\frac{\pi}{10} = \frac{\sqrt{5+\sqrt{5}}}{8}$ බව පෙන්වන්න.

22 A/L අපි [ papers group ]

14.

a) $x \neq -1$ සඳහා $f(x) = \frac{x(x+3)}{(x+1)^2}$ යැයි ගනිමු. .

$f(x)$ හි පළමු ව්‍යුත්පන්නය වූ $f'(x)$ යන්න $f'(x) = \frac{3-x}{(x+1)^3}$ මඟින් දෙනු ලබන බව පෙන්වන්න.

**ඒ නයින්,** $f(x)$ වැඩිවන ප්‍රාන්තරය හා $f(x)$අඩුවන ප්‍රාන්තරය සොයන්න.

තව ද $f(x)$ හි දෙවන ව්‍යුත්පන්නය වූ $f''(x)$ යන්න $f''(x) = \frac{2(x-5)}{(x+1)^4}$ මඟින් දෙනු ලබන බවත් පෙන්වන්න.

ස්පර්ශෝන්මුඛ ,$y$ අන්තඃඛණ්ඩය ,හැරුම් ලක්ෂ්‍ය හා නතිවර්තන ලක්ෂ්‍ය දක්වමින් $y = f(x)$ ප්‍රස්තාරයේ දළ සටහනක් අඳින්න.

b) දිග $a$ වන කම්බියක් කොටස් දෙකකට කපා ඒවා පිළිවෙලින් සමචතුරස්‍රයක හා වෘත්තයක හැඩයට නමා තිබේ. එසේ සෑදෙන වස්තු වල වර්ගඵලයන්ගේ ඓක්‍යයේ අඩුතම අගය $\frac{a^2}{4(\pi+4)}$ වන බව පෙන්වන්න.

15.

a) සියලු $x \in \mathbb{R}$ සඳහා $x^3 + 5x^2 + 14x + 29 = A(x+2)(x^2+9) + (2x+b)(x+2) + (x^2+9)$ වන පරිදි $A$ හා $B$ නියත පවතින පරිදි දී ඇත.

$A$ හා $B$ හි අගයන් සොයන්න.

**ඒ නයින්** $\frac{x^3+5x^2+14x+29}{(x+2)(x^2+9)}$ යන්න භින්න භාග වලින් ලියා දක්වා,

$\int \frac{x^3+5x^2+14x+29}{(x+2)(x^2+9)} dx$ සොයන්න.

b) කොටස් වශයෙන් අනුකලනය භාවිතයෙන්, $\int_0^{\frac{\pi}{3}} 2\, sinx \ln(secx)\, dx$ අගයන්න.

c) $0 \leq \theta \leq \frac{\pi}{4}$ සඳහා $x = 2\cos 2\theta$ ආදේශය භාවිතයෙන් $\int_0^2 \sqrt{\frac{2-x}{2+x}}\, dx = \pi - 2$ බව පෙන්වන්න.

**ඒ නයින්** $\int_0^{\sqrt{2}} x\sqrt{\frac{2-x^2}{2+x^2}}\, dx$ හි අගය අපෝහනය කරන්න.

22 A/L අපි [ papers group ]

16.

a) $ABCD$ යනු සෘජුකෝණාස්‍රයකි.$AB$ පාදය $y = mx$ රේඛාවට සමාන්තර වේ. $A, B$ හා $D$ ශීර්ෂ පිළිවෙලින් $y = a$ , $x = b$ හා $x = -b$ රේඛා මත පිහිටයි. $C$ ශීර්ෂයේ පථය,

$(m^2-1)x - my + am + (m^2+1)b = 0$ සරල රේඛාව බව සාධනය කරන්න.

b) $2g_1g_2 + 2f_1f_2 = c_1 + c_2$ නම්, $x^2 + y^2 + 2g_1x + 2f_1y + c_1 = 0$ හා $x^2 + y^2 + 2g_2x + 2f_2y + c_2 = 0$ වෘත්ත දෙක ප්‍රලම්බව ඡේදනය වන බව සාධනය කරන්න.

කේන්ද්‍රය $y = x + 1$ රේඛාව මත පිහිටන සේ $(3,7)$ ලක්ෂ්‍යය හරහා යන එක එකක අරය ඒකක 3 ක් වන වෘත්ත දෙකක් ඇඳිය හැකි බව පෙන්වන්න.

මෙම වෘත්ත වල සමීකරණ සොයා ඒවා ප්‍රලම්බ ලෙස එකිනෙක ඡේදනය වන බව පෙන්වන්න.

17.

a) $f(x) = 11\,cos^2x + 16\cos x \sin x - sin^2x$ යන්න $a + b\cos(2x - \alpha)$ ආකාරයෙන් ප්‍රකාශ කරන්න.
$a, b, \alpha$ යනු නිර්ණය කළ යුතු නියත වේ.

ඒ නයින් $0 \leq x \leq \pi$ සඳහා $f(x) = 11\,cos^2x + 16\cos x \sin x - sin^2x$ හි ප්‍රස්තාරයේ දළ සටහනක් අඳින්න.

$0 \leq x \leq \pi$ තුළ $f(x) = 0$ සමීකරණයෙහි විසඳුම් සොයන්න.

b) ඕනෑම ත්‍රිකෝණයක් සඳහා කෝසයින් නීතිය ප්‍රකාශ කර සාධනය කරන්න.

$ABC$ ත්‍රිකෝණයේ $BC, CA, AB$ පාදවල දිග පිළිවෙලින් $a\,, a + d, a + 2d$ වේ.$Cos\ C = \frac{1}{2} - \frac{3d}{2a}$ බව සාධනය කරන්න.

ඒ නයින් $\frac{2\pi}{3} < C < \pi$ සඳහා $\frac{d}{a}$ ට තිබිය යුතු අගය පරාසය සොයන්න.

c) $\tan^{-1}(5\,tan^2x) + \tan^{-1}(cos^2x) = \frac{\pi}{4}$ සමීකරණය විසඳන්න.

22 A/L අපි [ papers group ]

"නැණ සයුර" අධ්‍යාපනික වැඩසටහන-2022

සරසවි පිවිසුම් අත්වැල

උතුරු මැද පළාත් අධ්‍යාපන දෙපාතර්මේන්තුව

## සංයුක්ත ගණිතය - II පත්‍රය

13 ශ්‍රේණිය

කාලය - පැය 03 මිනිත්තු 10

නම : ..........................................................................................

**උපදෙස් :**

* මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විත වේ;
* ***A* කොටස** (ප්‍රශ්න 1-10 ) සහ *B* **කොටස** ( ප්‍රශ්න 11-17 )
* ***A* කොටස :**

  **සියලු ම** ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න. එක් එක් ප්‍රශ්නය සඳහා ඔබේ පිළිතුරු , සපයා ඇති ඉඩෙහි ලියන්න. වැඩිපුර ඉඩ අවශ්‍ය වේ නම්, ඔබට අමතර ලියන කඩදාසි භාවිත කළ හැකි ය.
* ***B* කොටස :**

  ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

**පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා පමණි.**

| (10) සංයුක්ත ගණිතය I | | |
|---|---|---|
| කොටස | ප්‍රශ්න අංකය | ලකුණු |
| A | 1 | |
| | 2 | |
| | 3 | |
| | 4 | |
| | 5 | |
| | 6 | |
| | 7 | |
| | 8 | |
| | 9 | |
| | 10 | |
| B | 11 | |
| | 12 | |
| | 13 | |
| | 14 | |
| | 15 | |
| | 16 | |
| | 17 | |
| | එකතුව | |

| | |
|---|---|
| I පත්‍රය | |
| II පත්‍රය | |
| එකතුව | |
| අවසාන ලකුණු | |

22 A/L අපි [ papers group ]

**අවසාන ලකුණු**

| | |
|---|---|
| ඉලක්කමෙන් | |
| අකුරින් | |

1) සමාන අරයන් සහිත ස්කන්ධ $m$ හා $5m$වන සුමට $A, B$ ගෝල දෙකක් සරල රේඛීයව එකම දිශාවට සුමට තලයක් මත $u$ හා $\lambda u, (0 < \lambda < 1)$ ප්‍රවේග වලින් චලිත වෙමින් සරලව ගැටේ. ගැටුම නිසා $A$ ගෝලය නිසල වේ. ගෝල අතර ප්‍රත්‍යාගති සංගුණකය $\frac{5\lambda+1}{5(1-\lambda)}$ බව පෙන්වන්න.

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

22 A/L අපි [ papers group ]

2) කාටිසියානු ඛණ්ඩාංක තලයේ මූල ලක්ෂ්‍යයේ සිට තිරසට $\theta$ කෝණයකින් ආනතව $u$ වේගයෙන් අංශුවක් ප්‍රක්ෂේපණය කෙරේ. අංශුව ඕනෑම $P = (x, y)$ ලක්ෂ්‍යයක පිහිටන විට $y = x\tan\theta - \frac{gx^2sec^2\theta}{2u^2}$ බව පෙන්වන්න. එනයින් හෝ අන් අයුරකින් හෝ $P$ හි දී අංශුවේ ගමන් දිශාව තිරසට $\alpha$ ආනත නම්, $tan\alpha + \tan\theta = \frac{2y}{x}$ බව ද පෙන්වන්න.

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

3) අචල කප්පියක් වටා යැවූ සැහැල්ලු අවිතන්‍ය තන්තුවක එක් කෙළවරක් තිරස් බිමක් මත වූ $3m$ ස්කන්ධයකට ද අනෙක් කෙළවර $m$ ස්කන්ධයකට ද ගැටගසා $m$ ,තිරස් බිමෙහි සිට $l$ උසකින් එල්ලෙමින් පවතී. දැන් $m$ ස්කන්ධය තිරස් බිමෙහි සිට $4l$ උසකින් තබා නිශ්චලතාවයේ සිට මුදා හරිනු ලැබේ. කප්පිය හා නොගැටෙන තන්තු කොටස් සියල්ල සිරස් වේ. ආවේගයෙන් මොහොතකට පසු $m$ ස්කන්ධයේ ප්‍රවේගය සොයන්න.

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

22 A/L අපි [ papers group ]

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

4) තිරසට $\alpha$ කෝණයකින් ආනත පාරක් දිගේ ළමයෙක් $5\,ms^{-1}$ වූ උපරිම වේගයෙන් බයිසිකලයක් පැදගෙන යයි. ළමයාගේ හා බයිසිකලයේ මුළු ස්කන්ධය $60\,kg$ වේ. ළමයාගේ ක්ෂමතාවය $400\,w$ වන අතර චලිතයට ප්‍රතිරෝධය $10\,N$ කි . $sin\alpha = \frac{7}{60}$ බව පෙන්වන්න. ප්‍රතිරෝධය එලෙසම පවතී නම්, බයිසිකලය පෙඩල් කිරීම නතර කළ විට , එය නිශ්චල වීමට ගන්නා කාලය සොයන්න.$(g = 10\,ms^{-1})$

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

5) ස්කන්ධය $M$ වන ලෑල්ලක් මත ස්කන්ධය $m$ වන මැඩියෙක් සිටියි. ලෑල්ල ගෙබිමක් මත තබා ඇති අතර ලෑල්ලට සාපේක්ෂව මැඩියා $v$ ප්‍රවේගයෙන් ඉදිරියට පනියි. මැඩියාට හා ලෑල්ලට $I = \Delta(m\underline{v})$ , යෙදීමෙන් ලෑල්ල චලනය වන ප්‍රවේගයත් මැඩියා ලෑල්ල මත ඇතිකරන ආවේගයත් සොයන්න.

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

22 A/L අපි [ papers group ]

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

6) $\underline{a} = 2\underline{i} + 3\underline{j}$ ද $\underline{b} = \lambda\underline{i} + \mu\underline{j}$ ද වේ. මෙහි $\lambda, \mu$ තාත්වික නියත ද $\mu > 0$ ද $\underline{i}$ හා $\underline{j}$ යනු සුපුරුදු ඒකක දෛශික ද වේ. $|b| = 1$හා $\underline{a}$ හා $\underline{b}$ දෛශික එකිනෙකට ලම්බක නම්, $\lambda$ හා $\mu$ සොයන්න.

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

7) සුමට ඒකාකාර $AB$ දණ්ඩක දිග $3a$ හා බර $W$ වේ. $AC = 4a$ වේ.මෙය $A$ හි දී අසව්කර ඇත්තේ, සිරස් තලයේ භ්‍රමණය විය හැකි වන පරිදි වේ. සැහැල්ලු සුමට $D$ මුදුවකට දණ්ඩ මත සර්පණය විය හැක. $D$ මුදුවට ඈදා ඇති අවිතන්‍ය තන්තුව $C$ නාදැත්ත උඩින් දමා $2w$ බර අංශුවකට සවිකර ඇත. $2w$ සිරස්ව එල්ලෙමින් පද්ධතිය සමතුලිතව තිබේ.




i. $CD$ තන්තුව $AB$ දණ්ඩට ලම්බක බව පෙන්වන්න.

ii. දණ්ඩ සිරසට ආනත කෝණය $\theta$ නම්,
$3W \tan\theta = 16\, w$ බව පෙන්වන්න

22 A/L අපි [ papers group ]

8) බර$w$ වූ අංශුවක් තිරසට $\alpha$ කෝණයක් ආනත රළු තලයක් මත තබා ඇත. මෙහි $\mu\ (< \tan\alpha)$ යනු අංශුව හා තලය අතර ඝර්ෂණ සංගුණකයයි. අංශුව සමතුලිතතාවයේ රඳවා ඇත්තේ තිරස්ව අංශුවට යෙදූ $P$ බලයක් මගිනි.

$\frac{w(\sin\theta - \mu\cos\theta)}{\cos\theta + \mu\, sin\theta} \leq P \leq \frac{w(\mu\cos\theta + \sin\theta)}{\cos\theta - \mu\, sin\theta}$ බව පෙන්වන්න.

9) $p(A) = \frac{1}{4}$ , $p(A|B) = \frac{1}{4}$ හා $p(A|B) = \frac{1}{2}$ බව දී ඇත. $p(B)$ සොයන්න.

22 A/L අපි [ papers group ]

10) ධන නිඛිලමය නිරීක්ෂණ පහක කුලකයක මධ්‍යන්‍යය හා මධ්‍යස්ථය පිළිවෙලින් 7 හා 9 වේ. නිරීක්ෂණ වල එකම මාතය 11 වේ නම්, නිරීක්ෂණ පහ සොයන්න.

**B කොටස**

11.

a) ඍජු මාර්ගයක් ඔස්සේ ධාවනය වන බස් රථයක රියදුරෙක් එයට ඉදිරියෙන් ඇති $H$ බස් නැවතුම් පොළෙහි බස් රථයට ගොඩ වීමට සිටින මගියෙකු දකියි. $AH = a\ (m)$ වන පරිදි වූ $A$ නම් ලක්ෂ්‍යයකට එළඹෙන විට , බස් රථයේ ප්‍රවේගය $u\ ms^{-1}$ විය. $H$ හි දී බස් රථය නවතින පරිදි $AB = BC = CH$ වන සේ වූ $A , B , C$ ලක්ෂ්‍යය වලදී රියදුරා පිට පිටම තිරිංග යොදයි. $AB , BC , CH$ ප්‍රාන්තර වල දී බස් රථයේ මන්දන පිළිවෙලින් $f$ ,$2f$ හා $3f$ වේ.

i. බස් රථයේ චලිතය සඳහා ප්‍රවේග කාල වක්‍රයක් අඳින්න. **ඒ නයින්** $f = \frac{u^2}{4a}$ බව පෙන්වන්න.

ii. $B$ හා $C$ වෙත පැමිණීමේදී බස් රථයේ ප්‍රවේග $u$ ඇසුරෙන් සොයන්න.

iii. $A$ සිට $H$ තෙක් යාමට ගතවන මුළු කාලය $\frac{4a}{u}\left(1 - \frac{\sqrt{30}+\sqrt{2}}{12}\right)$ බව පෙන්වන්න.

b) නැවක් ඍජු මුහුදු ගමන් මගක $u\ km^{-1}$ ඒකාකාර වේගයෙන් නැගෙනහිරට යාත්‍රා කරයි. වරායක් එහි ගමන් මගට දකුණෙන් ඇත. වරායේ සිට එම ගමන් මගෙහි ආසන්නම ලක්ෂ්‍යය වන $A$ ට ඇති දුර $a\ km$ වේ. $A$ ලක්ෂ්‍යයට ලගාවීමට පෙර වරායේ සිට $b\ (> a) km$ දුරින් නැව ඇති විට , එය අල්ලා ගැනීම සඳහා බෝට්ටුවක් වරායෙන් පිටත් වෙයි. බෝට්ටුවේ වේගය $v$ නම්, $\left(u > v > \frac{au}{b}\right)$ නිශ්චිත ස්ථාන දෙකකදී නැව අල්ලා ගැනීමට එයට හැකි බවත් ඒ සඳහා ගතවන කාල පැය $\frac{2\sqrt{b^2v^2 - a^2u^2}}{u^2 - v^2}$ කින් වෙනස් වන බවත් පෙන්වන්න.

12.




a) රූපයේ දැක්වෙන ආකාරයට සුමට කප්පියක් උඩින් ගොස් සිරස් ලෙස එල්ලෙන $M$ ස්කන්ධයක් රැගත් තන්තුවක් මගින් සුමට , තිරස් මේසයක් දිගේ තිරස් ලෙස අදිනු ලබන $2M$ ස්කන්ධයක් ඇති සුමට කුඤ්ඤයක තිරසට $45^\circ$ ආනත මුහුණත මත $m$ ස්කන්ධයක් ඇති අංශුවක් තබනු ලැබේ. චලිත සියල්ලම වැඩිතම බෑවුම් රේඛාවක් හරහා යන සිරස් තලයක වෙයි. කුඤ්ඤයට සාපේක්ෂව $m$ හි ත්වරණය $\frac{\sqrt{2}g(4M+m)}{6M+m}$ බව පෙන්වන්න.

22 A/L අපි [ papers group ]

b) කේන්ද්‍රය $O$ හා අභ්‍යන්තර අරය $a$ වන අචල සුමට කුහර ගෝලයක ඇතුළත පහලම ලක්ෂ්‍යයේ සිට $\sqrt{\frac{7ag}{2}}$ වේගයෙන් ස්කන්ධය $m$ වූ $P$ අංශුවක් තිරස්ව ප්‍රක්ෂේපණය කරනු ලැබේ. $OP$ රේඛාව යටි අත් සිරස සමඟ $\theta$ කෝණයක් සාදන විට , අංශුවේ වේගය $v$ යන්න $v^2 = \frac{ga}{2}(3 + 4\cos\theta)$ මගින් දෙනු ලබන බව පෙන්වන්න. එවිට අංශුව මත අභිලම්බ ප්‍රතික්‍රියාව ද සොයන්න.
අංශුව ගෝලයේ පෘෂ්ඨයෙන් ඉවත් වන විට , $OP$ උඩු අත් සිරස සමඟ සාදන කෝණය සොයා , එම අවස්ථාවේ දී අංශුවේ වේගය $\sqrt{\frac{1}{2}ag}$ බව පෙන්වන්න.

අනතුරුව ඇතිවන චලිතයේදී අංශුව පළමු වරට $O$ හරහා වන තිරස් තලයට ළඟාවන විට එහි වේගය $a$ හා $g$ ඇසුරෙන් සොයන්න.

22 A/L අපි [ papers group ]

13. ස්වභාවික දිග $a$ හා ප්‍රත්‍යස්ථතා මාපාංකය $mg$ වූ සැහැල්ලු ප්‍රත්‍යාස්ථ තන්තුවක් අචල $O$ ලක්ෂ්‍යකට සම්බන්ධ කර ඇත. එක එකක ස්කන්ධය $m$ බැගින් වූ අංශු දෙකක් ,තන්තුවේ අනෙක් කෙළවර වූ $P$ ට ඈඳනු ලැබ, පද්ධතිය සමතුලිතව එල්ලෙයි. මෙම පිහිටීමේදී තන්තුවේ විතතිය $2a$ බව පෙන්වන්න. දැන් අංශුවලින් එක් අංශුවක් ගිලිහී යන අතර ස්කන්ධය $m$ වූ ඉතිරි අංශුව තන්තුවේ කෙළවරට සම්බන්ධව තිබිය දී චලනය වීමට පටන් ගනියි. $P$ හි චලිත සමීකරණය $\ddot{x} + \frac{g}{a}(x - 2a) = 0$ලබා ගන්න.

මෙහි$x\ (\geq a)$ යනු තන්තුවේ දිග වේ.

$X = x - 2a$ ලෙස ගැනීමෙන් ඉහත චලිත සමීකරණය $\ddot{X} + \omega^2 X = 0$ ආකාරයෙන්

නැවත ලියන්න. සරල අනුවර්තී චලිතයේ කේන්ද්‍රය $C$ හා විස්තාරය සොයන්න.

$C$ ලක්ෂ්‍යයේදී අංශුවට සිරස් ආවේගයක් දෙනු ලබන්නේ එහි ප්‍රවේගය තෙගුණ වන පරිදි ය.

තන්තුව ඇදී පවතින තුරු චලිතයේ කේන්ද්‍රය .එලෙසම පවතින බවත් , මෙම චලිතයේ

විස්තාරය $3a$ වන බවත් පෙන්වන්න.

**ඒ නයින්** $\sqrt{\frac{a}{g}}\left(\frac{\pi}{2} + \sin^{-1}\frac{1}{3}\right)$ මුළු කාලයකට පසුව තන්තුව බුරුල් වන බව පෙන්වන්න.

තන්තුව බුරුල් වන මොහොතේ දී අංශුවේ ප්‍රවේගයද සොයන්න.

14.

a) $OAB$ ත්‍රිකෝණයක් ද $D$ යනු $AB$ හි මධ්‍ය ලක්ෂ්‍යය යැයි ද ගනිමු. $E$ යනු $OD$ හි මධ්‍ය ලක්ෂ්‍යයි. $F$ ලක්ෂ්‍යය $OA$ මත පිහිටා ඇත්තේ $OF:FA = 1:2$ වන පරිදි ය. $O$ අනුබද්ධයෙන් $A$ හා $B$ හි පිහිටුම් දෛශික පිළිවෙලින් $\underline{a}$ හා $\underline{b}$ නම්, $\overrightarrow{BE}$ හා $\overrightarrow{BF}$ දෛශික $\underline{a}$ හා $\underline{b}$ ඇසුරෙන් ප්‍රකාශ කරන්න.

$B$ , $E$ හා $F$ ඒක රේඛීය බව අපෝහනය කර $BE : EF$ අනුපාතය සොයන්න.

$\overrightarrow{BE}.\overrightarrow{DF}$ අදිශ ගුණිතය $|\underline{a}|$ හා $|\underline{b}|$ ඇසුරෙන් සොයා $|\underline{a}| = 3\ |\underline{b}|$ නම්, $\overrightarrow{BE}$ යන්න $\overrightarrow{DF}$ ට ලම්බක බව පෙන්වන්න.

b) $OXY$ තලයේ $OX$ හා $OY$ අක්ෂ ඔස්සේ ඒකක දෛශික පිළිවෙලින් $\underline{i}$ හා $\underline{j}$ වේ. ඒකතල බල පද්ධතියක් පහත ආකාරයෙන් $OXY$ තලයේ ක්‍රියා කරයි.

| ලක්ෂ්‍යය | පිහිටුම් දෛශිකය | බලය |
|---|---|---|
| A | $2\underline{i} - \underline{j}$ | $3\underline{i} - 2\underline{j}$ |
| B | $\underline{i} + \underline{j}$ | $P\underline{i} + Q\underline{j}$ |
| C | $-2\underline{i} + \underline{j}$ | $-5\underline{i} - 4\underline{j}$ |
| D | $-\underline{i} - 4\underline{j}$ | $-\underline{i} + 2\underline{j}$ |

i. ඉහත බල පද්ධතිය කාටිසීය ඛණ්ඩාංක තලයක දක්වන්න.

ii. පද්ධතිය යුග්මයකට තුල්‍ය නම්, $P$ හා $Q$ නිර්ණය කර , යුග්මයේ විශාලත්වය හා යුග්මය ක්‍රියාකරන අත සොයන්න.

iii. මෙම පද්ධතියට මූල ලක්ෂ්‍යයේ දී ක්‍රියා කරන $\underline{i} + \underline{j}$ බලයක් එකතු කළහොත් නව පද්ධතියේ සම්ප්‍රයුක්තයේ විශාලත්වය හා දිශාව සොයන්න. සම්ප්‍රයුක්තයේ ක්‍රියා රේඛාවේ සමීකරණය සොයන්න.

15.

a) ඒකක දිගක බර $w$ වන ඒකාකාර දඬු පහක් $A,B,C,D$ හා $E$ හි දී සුමට ලෙස සන්ධි කිරීමෙන් $ABCDE$ පංචාස්‍රය තනා තිබේ.$ED = DC = a$ හා $AE = BC = b$ වේ. තිරස් මේසයක් මත $AB$ සවි කිරීමෙන් සිරස් තලයක රඳවා ඇති මෙම පංචාස්‍රය $E\hat{A}B = A\hat{B}C = 120^\circ$ හා $A\hat{E}D = B\hat{C}D = 90^\circ$

වන සේ සමතුලිතතාවයේ තබා ඇත්තේ $E$ හා $C$ සන්ධි වලට සම්බන්ධ කර ඇති සැහැල්ලු තන්තුවක් මඟිනි. තන්තුවේ ආතතිය $\frac{w(5a+b)}{2\sqrt{3}}$ බව පෙන්වන්න.

b)




22 A/L අපි [ papers group ]

සැහැල්ලු දඬු පහකින් සමන්විත $ABCD$ රාමු සැකිල්ලක් රූපයේ දැක්වෙන පරිදි සමතුලිතතාවයේ තබා ඇත්තේ $A$ හි දී අචල ලක්ෂ්‍යයකට නිදහස් ලෙස අසව් කිරීමෙනි. $AB$ සිරස් ද $BC$ තිරස් ද වන අතර $A\hat{D}B = 90^\circ , D\hat{B}C = D\hat{C}B = 30^\circ$ වේ. $C$ හි දී $100\ N$ භාරයක් එල්ලෙන අතර තිරස් $P$ බලයක් $B$ හි දී $CB$ අතට ක්‍රියා කරයි.$P$ හි අගය සොයන්න. $B , C , D$ සන්ධි සඳහා ප්‍රත්‍යා බල සටහනක් ඇඳීමෙන් දඬු සියල්ලෙහිම ප්‍රත්‍යාබල , ආතති ද තෙරපුම් ද ලෙස වෙන්කර දක්වමින් සොයන්න.

16. උස $h$ වූ ඒකාකාර ඝන ඍජු වෘත්තාකාර කේතුවක ස්කන්ධ කේන්ද්‍රය,

එහි පතුලේ කේන්ද්‍රයේ සිට $\frac{h}{4}$ දුරකින් පිහිටන බව පෙන්වන්න.

අරය $r$ වන උස $h$ වූ ඒකාකාර ඍජු සිලින්ඩරයකින් ,

උස $h$ සහ පතුලේ අරය $r$ වන ඍජු වෘත්තාකාර කේතුවක් ඉවත් කර

සාදා ඇති , $S$ සංයුක්ත වස්තුවක් රූපයේ දැක්වේ.

h



O

$S$ හි ස්කන්ධ කේන්ද්‍රය $O$ සිට , $\frac{3h}{8}$ දුරකින් පිහිටන බව පෙන්වන්න.

දැන් මෙම $S$ වස්තුව $O$ ඉහලින්ම පිහිටන පරිදි තිරස් තලයක් මත තබා තලය සෙමින් ඇල කරනු ලැබේ. ලිස්සීම වැලැක්වීමට ප්‍රමාණවත් ඝර්ෂණයක් ඇත්නම්, තලය තිරස සමඟ $\tan^{-1}\left(\frac{8r}{5h}\right)$ ට වඩා වැඩි කෝණයක් ඇල කරන විට , මෙම $S$ වස්තුව පෙරලෙන බව පෙන්වන්න.

17. a)

$E_1$ හා $E_2$ යනු සසම්භාවී පරීක්ෂණයක $\Omega$ නියැදි අවකාශයට අදාල සිද්ධි අවකාශයේ වූ අන්‍යෝන්‍ය වශයෙන් බහිෂ්කාර සිද්ධි දෙකක් ද $D$ යනු $S$ හි ඕනෑම සිද්ධියක් ද විට ,

$$P(E_1|\,D) = \frac{P(E_1).P\,(D|E_1)}{P(E_1).P\,(D|E_1)+P(E_2).P\,(D|E_2)}$$ බව පෙන්වන්න.

පළාත් පාලන ආයතනයකට සභාපති ධූරයට තේරී පත්වීම සඳහා $A$ හා $B$ අපේක්ෂකයන් දෙදෙනෙක් පමණක් තරඟ කරයි. $A$ ජය ගැනීමේ සම්භාවිතාව $0.6$ ද $B$ ජය ගැනීමේ සම්භාවිතාව $0.4$ ක් ද වේ. $A$ ජයගතහොත් එම ආයතනයට නව ගොඩනැගිල්ලක් ලබා දීමේ සම්භාවිතාව $0.35$ ක් ද $B$ ජයගතහොත් එම ආයතනයට නව ගොඩනැගිල්ලක් ලබා දීමේ සම්භාවිතාව $0.85$ ක් ද වේ.

i. ආයතනයට නව ගොඩනැගිල්ලක් ලබා දීමේ සම්භාවිතාව

ii. ආයතනයට නව ගොඩනැගිල්ලක් ලැබුනේ නම්, $A$ ජය ගැනීමේ සම්භාවිතාව සොයන්න.

b) එක්තරා පරීක්ෂණයකට පෙනී සිට ඉන් සමත් වූ ශිෂ්‍යයන් $70$ ක් ලබා ගත් ලකුණු වල සමූහිත සංඛ්‍යාත ව්‍යාප්තියක පහත වගුවේ දැක්වේ. සමත්වීමේ ලකුණ $30$ ක් වේ.

| පන්ති ලකුණ | සංඛ්‍යාතය |
|---|---|
| 35 | 5 |
| 45 | 10 |
| 55 | 15 |
| 65 | 30 |
| 75 | 5 |
| 85 | 5 |

$y_i = \frac{1}{10}(x_i - 55)$ යන පරිණාමනය භාවිතයෙන් මෙම ලකුණු ව්‍යාප්තියේ මධ්‍යනය හා විචලතාවය නිමානය කරන්න.

තමම පරීක්ෂණයට සහභාගි වූ මුළු සිසුන් ගණන $100$ ක් වන අතර මධ්‍යන්‍යය හා සම්මත අපගමනය පිළිවෙලින් $48$ හා $21.5$ බව දී ඇත. අසමත් සිසුන් තිස් දෙනාගේ මධ්‍යන්‍යය හා සම්මත අපගමනය නිමානය කරන්න.

22 A/L අපි [ papers group ]